# ආරක්ෂක අමාත්‍යාංශය

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRI)

## ශ්‍රී ලංකාව සඳහා "ජාතික ගොඩනැගිලි සංග්‍රහයක් (National Building code of Sri lanka) (NBCSL)" විධිමත්ව සකස්කොට ස්ථාපිත කිරීම සඳහා වන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය (PIU) සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (NBRI) විසින් නෛතිකව බලාත්මක කළ හැකි හා ආපද අහිතකර බලපෑම්වලට මුහුණදිය හැකි වන පරිදි වූ ජාතික ගොඩනැගිලි සංග්‍රහයක් සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව වර්ෂ 2026 - 2028 කාලය සඳහා ශ්‍රී ලංකා ජාතික ගොඩනැගිලි සංග්‍රහයක් (NBCSL) විධිමත්ව සකස්කොට ස්ථාපිත කිරීම සහ ශීර්ෂය යටතේ වන අතිශය වැදගත් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබයි.

අදාළ ව්‍යාපෘතිය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආරක්ෂිත භාවය තත්ත්ව, තිරසරභාවය හා අහිතකර බල පෑම් අවම කිරීම ශක්තිමත් කිරීම සඳහා නවීනතම තාක්ෂණ ප්‍රමිතීන් හා නියාමන ප්‍රතිපාදන ව්‍යුහාත්මක ආරක්ෂිත භාවය ගිනි ආරක්ෂණය, ජෛවතාක්ෂණ සලකා බැලීම් ආපද අවදානම අවම කිරීම හා තිරසර ගොඩනැගිලි පරිචයන් අරමුණු කරනු ලබයි. මෙම මූලාරම්භය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) හා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) යන ආයතනද ඇතුලත්ව ප්‍රධාන ජාතික හවුලකරුවන් සමග සහයෝගිතාවයෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් තනතුරු ඇබෑර්තු සඳහා උනන්දුවක් දක්වන ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**I) සිවිල් හා ව්‍යුහ ඉංජිනේරු (තනතුරු 01), භූ තාක්ෂණික ඉංජිනේරු (තනතුරු 01) වාස්තු විද්‍යාඥ (තනතුරු 01) ප්‍රමාණ සමීක්ෂක (ප්‍රසම්පාදන විශේෂඥ) (තනතුරු 01) කොන්ත්‍රාත් පදනමින්**

**අධ්‍යාපනික සුදුසුකම් : (පහත 1 හෝ 2 හෝ 3)**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් භූවිද්‍යා / ඉංජිනේරු / වාස්තු විද්‍යා / ප්‍රමාණ සමීක්ෂණ හෝ අදාළ ක්ෂේත්‍රයේ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසු විෂය එකතුවක විශේෂ උපාධියක්,

**හෝ**

2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සුදුසු විෂය එකතුවක සාමාන්‍යය උපාධියක්,

**සමග**

තනතුරට අදාළ ක්ෂේත්‍රයේ භූ විද්‍යා/ ඉංජිනේරු/ වාස්තු විද්‍යා/ ප්‍රමාණ සමීක්ෂණ පශ්චාත් උපාධියක්,

**හෝ**

3. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය

**සටහන :** තනතුරට අදාළ පර්යේෂණ පළපුරුද්ද සැතුවීම අමතර සුදුසුකමකි.

**වැටුප පරිමාණය :**

01.01.2026 දින සිට බලපැවැත්වෙන පරිදි : රුපියල් 81,675.00 + රුපියල් 17,800.00 (ජීවන අංක දීමනාව)

01.01.2027 දින සිට බලපැවැත්වෙන පරිදි : රුපියල් 91,650.00 + රුපියල් 17,800.00 (ජීවන අංක දීමනාව)

**සටහන :**

i) කොන්ත්‍රාත් කාලය තුළ වැටුපෙහි වෙනස් වීම් සිදු නොවේ.

ii) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

iii) තනතුරට අදාළව රාජකාරී නියමාකාරයෙන් ඉටු කිරීමටත්, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් හැකි පරිදි මනා ශාරීරික හා මානසික සුවතාවයෙන් සිටිය යුතුය.

iv) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

v) වයස අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර, 45ට නොවැඩි විය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ:**

- ජීවන අංක දීමනාව
- ආයතනය මගින් සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% හා සේවක භාර අරමුදල සඳහා 3% දායකත්වයක් ලබාදේ.
- වෙනත් රජයේ අනුමත දීමනාද හිමිය.

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය. සම්පූර්ණ ජීව දත්ත සමග සහතිකවල පිටපත් ඇතුළත් අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් **2026.06.22** දිනට පෙර පහත සඳහන් අය වෙත එවිය යුතුය. කරුණාකර අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කරන්න.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**